# මොනරාගල ප්‍රාදේශීය සභාව
# 2022.08.12 දින මහ සභා වාර්තාව

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ පනස් තුන්වන (53) සභා වාරය 2022.08.12 වන දින ප.ව 2.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී.චාමර නානායක්කාර මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයජීලන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුල කුමාරසිරි මැතිතුමා (ප්‍රතිපක්ෂනායක) |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| සභා ලේකම් | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

**නොපැමිණීම** **- නැත**

**පිළිගැනීම**

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 01.පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදි.

එහිදී සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පසු ගිය මස මහ සභා වාර්තාව ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන්ගේ සහ කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාවේ ඒකමතික එකඟතාවයෙන් සභා සම්මත කරන ලදි.

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

නැත

## 03.සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම.

නැත

## 04.යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම

නැත

## 05.යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

## 05.1.ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

### යෝජනා අංක 01

මොණරාගල කුමාරදොළපාර සමූපකාරය අසල පිහිටි ආර්.එම්. ගයාෂාන් ගීමල් මහතාට අයිති ඉඩමෙහි පවත්වාගෙන ගිය බ්ලොග් ගල් ව්‍යාපාරය සඳහා ප්‍රාදේශීය සභාව මගින් මීට පෙර ලබා දී ඇති ජල සම්බන්ධතාවය සඳහා ව්‍යාපාරික බිලක් ලෙස මුදල් ගෙවීම් සිදු කර ඇති අතර මීට මාස තුනක පමණ පෙර සිට එම බ්ලොග් ගල් ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම නවතා දමා ඇති බැවින් දැනට එහි ඇත්තේ කුඩා කාමරයක් පමණක් බැවින් මෙම තත්ත්වය හේතුවෙන් මෙම ජල සම්බන්ධතාවය සාමාන්‍ය ජල සම්බන්ධතාවක් ලෙස වෙනස් කර ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින් ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් මහ සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම තත්ත්වය සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක යොදවා සොයා බැලීමක් සිදු කර මේ වන විට එම ස්ථානයේ කිසිඳු ව්‍යාපාරික කටයුත්තක් සිදු නොකරන බවට නිර්දේශ කර ගැනීමෙන් අනතුරුව මෙම ස්ථානයට සපයා ඇති මාසික ජල ගාස්තුව සඳහා මේ දක්වා අය කළ මුදලින් අඩක් ජල ගාස්තු ලෙස සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 02**

වෙලේවත්ත කැප්පෙටිපොළ මාවත හී පදිංචි එච්.කේ.එම් සෝමපාල මහතා විසින් මොණරාගල නගරයේ සිට වෙලේවත්ත, බෙරන්හාන, විහාරමුල්ල ආදී ගම්මාන කිහිපයක් වෙත පිවිසීමට ඇති මහවෙල වෙල්යාය මැදින් පිහිටා ඇති මාර්ගය මේ වන විටත් කොන්ක්‍රීට් දමා සකස් කර ඇති අතර මෙහි තවත් මීටර් 65ක් පමණ කොන්ක්‍රීට් කිරීමට ඉතිරිව ඇති බැවින් මෙම කොටසත් එසේම මෙම මාර්ගයේ දැනට පවතින ගමන් කිරීමට පවා අපහසු ඉතා කුඩා අබලන් සහිත පාලමක් ද පවතින අතර මෙම මාර්ගය භාවිත කරන කෘෂිකර්මාන්ත කටයුතු කරන ගොවීන්ටත්, පාසල් යන දූවා දරුවන්ටත්, රැකීරක්ෂා වලට යන යන එන අයටත් ඉතාමත් අපහසු තත්ත්වයක් ගෙන දී ඇති බැවින් මෙම මාර්ග කොටස සහ නව පාලමක්ද ගම්වාසීන් හා මහවෙල කුඹුරු යායේ ගොවීන් වෙනුවෙන් සකස් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහා සහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී. එහිදී මීට පෙර අවස්ථාවන් වලදී තමන් විසින් ඉදිරිපත් කර මහ සභාවේ යෝජනා වී ඇති කෘෂි මාර්ගද හැකි ඉක්මනින් පිළිසකර කර දෙන ලෙස ද ගරු මන්ත්‍රීතුමා වැඩි දුරටත් සඳහන් කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

බොහෝ පිරිසක් භාවිත කරන මාර්ගයක් බැවින් කාර්මික නිලධාරී මහතා මගින් මේ සම්බන්ධයෙන් නිර්දේශයක් ගෙන පළාත් පාලන කොමසාරිස් තුමන් විසින් ලබා දී ඇති උපදෙස් ද පදනම් කර ගනිමින් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව පවතින සහා අරමුදල්ද සැලකිල්ලට ගෙන ගම් වාසීන්ගේද සහයෝගය ඇතිව මෙම සංවර්ධන කටයුතු සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යොජනා අංක 03**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් නව බස් නැවතුම්පළ ගහබඩ කඩ කාමර 12ක් පවතින අතර මේ වන විට මෙම කඩ කාමර දෙමහල් කඩ කාමර ලෙස පවතින නමුත් මෙම කඩ කාමර සඳහා ගිවිසුම් ගත වී ඇත්තේ එක් කඩ කාමරයක් ලෙස බැවින් මෙම තත්ත්වය අවස්ථා කිහිපයකදීම විගණන විමසුම ට ද ලක් වී ඇති අතර දැනට මෙහි ඉහළ සහ පහළ මාලයේ කඩ කාමර සඳහා මසකට රු.6200.00 ක්ද අංක 01 කඩ කාමරය සඳහා පමණක් මසකට රු.12200.00 ක මුදලක්ද අය කරන අතර දෙමහල් ලෙස භාවිත වන මෙම කඩ කාමර සඳහා ගිවිසුම්ගත වීම සම්බන්ධව සභා තීරණය සහ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට වයි.උපුල් ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී සභාවෙන් කළ විමසීම් වලින් අනතුරුව මෙහි බිම් මහලේ ඉදිකර ඇති වෙළසැල් 12 ට අමතරව ඉහල මහලයේද ඉදිකර ඇති වෙළදසැල් සඳහාද පොදුවේ එක් වෙළදසැලක් සේ සලකා ගිවිසුම් ගතවී ඇති අතර ඒ අනුව වෙන් වෙන් වශයෙන් මෙම වෙළදසැල් දෙක සඳහා ගාස්තු අය කිරීම පමණක් මේ දක්වා සිදු කළ බව ගරු සභාපතිතුමා මෙහිදී සඳහන් කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කඩ කාමර සඳහා මෙතෙක් සිදු කර ඇති කටයුතු විධිමත් නොවන බැවින් ඒ සෑම වෙළදසැලක් සඳහාම වෙන් වෙන් වශයෙන් නීත්‍යානුකූලව ගිවිසුම් ගත වීම සිදු විය යුතු බවත්,එසේ ගිවිසුම් ගත වූවාට පසුව මෙම වෙළදසැල් සඳහා වෙන් වෙන් වශයෙන් කඩ කුලී අය කිරීම සුදුසු බවත්, එසේ අය කරන මුදල අංක 01 කඩ කාමරය සඳහා මෙතෙක් අය කළ ආකාරයටම අංක 01 උඩු මහලේ කඩ කාමරය සඳහා රු.4000.00ක් ද පහළ මහලේ අංක 01 කඩ කාමරය සඳහා රු.8200.00 ක්ද ලෙසත්, උඩු මහලේ ඉතිරි කඩ කාමර සඳහා රු. 2000.00 ක් ද , පහළ මහලේ ඉතිරි කඩ කාමර සඳහා රු.4200.00 ක්ද වශයෙන් මෙම බදු මුදල් ගිවිසුම් ගත වීමෙන් අනතුරුව අය කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 04**

මොණරාගල ප්‍රාදේශීය සභාවට අයත් දේපල තුළින් හිඟ වරිපනම් බදු, කඩ කුලී, ඉදිකිරීම් ගාස්තු හා ප්‍රධාන මුදල් විශාල ප්‍රමාණයක් අයවීමට ඇති අතර නමුත් මෙම වරිපනම් බදු මුදල් අය කිරීම සඳහා ජංගම සේවාවන් ද පවත්වන ලද අතර තව ද හිඟ නිවේදනද බෙදා අවසන් කර ඇති අතර නැවතත් ගෙවීම් පැහැර හරින දේපල තහනමට ගැනීමට කටයුතු කළ යුතු බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් පළාත් පාලන කොමසාරිස් තුමා මගින් පහත නිලධාරීන් (ආදායම් පරීක්ෂකවරුන්) ගෙන්වාගැනීමට අවශ්‍ය කටයුතු කිරීමටත් ඒ අයට නවාතැන් පහසුකම් කැමබීම ලබාදීම ආදී කටයුතු සඳහා සහා අරමුදලින් වියදම් කිරීම සඳහා සහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

- පී.ජී එච්.එච්. ද සිල්වා මයා (ආදායම් පරීක්ෂක) - මහ නගර සභාව, බදුල්ල
- ඩී. එම්. තරිඳු චාමිකර මයා (ආදායම් පරීක්ෂක) - ප්‍රාදේශීය සභාව, බුත්තල
- ආර්.එම්.සී. උදය කුමාර මයා (ආදායම් පරීක්ෂක) - ප්‍රාදේශීය සභාව, සොරණාතොට

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මේ වන විට වරිපනම් දේපල වලින් විශාල මුදලක් හිඟ වශයෙන් අය කර ගැනීමට ඇති අතර දැනටමත් මේ සඳහා සභා ලේකම්තුමන්, ආදායම් පරීක්ෂක ඇතුළු විෂයය නිලධාරීන් විසින් මෙම හිඟ කුලී අය කර ගැනීම සඳහා තක්සේරු නිවේදන බෙදා හැරීම,ජංගම සේවා පවත්වා හිඟ අය කර ගැනීමට කටයුතු කිරීම ආදී සියලු ක්‍රියාමාර්ග ගත්තද තව දුරටත් විශාල හිඟ මුදලක් අය වීමට ඇති අතර ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව මීලඟ පියවර වශයෙන් රතු නිවේදන නිකුත් කර දේපල තහනමට ගැනීම සඳහා අදාල නිලධාරීන් විසින් අවසර ඉල්ලා ඇති අතර රටේ පවතින තත්ත්වය මෙන්ම ජනතාව මුහුණ දී සිටින දුෂ්කරතා හා දැඩි පීඩාකිරි තත්ත්වයන් සැලකිල්ලට ගෙන දේපල තහනමකට නොයා මෙම හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරමු බවට ගරු සභාපතිතුමන් සඳහන් කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ බොහෝ වේලාවක් සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පවතින ආර්ථික අර්බුදය සහ අනෙකුත් ප්‍රශ්න හමුවේ ජනතාව පීඩාවට පත්ව ඇති මෙවන් මොහොතක මෙසේ දේපල තහනමට ගැනීම වර්ථමානයේ ක්‍රියාත්මක කිරීම සුදුසු ක්‍රියාමාර්ගයක් නොවන බැවින් දේපල තහනමට යාම පසුවට කල් දමා මෙම හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බැවින්, මෙම සියලු හිඟ ආදායම් ඇති දේපළ හිමිකරුවන් වෙත නැවත ලිපි මගින් දැනුම් දී හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කිරීමට ආදායම් පරීක්ෂකවරුන් වෙත කඩිනමින් දැනුම් දී අවශ්‍ය පියවර ගන්නා ලෙස මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 05**

මොණරාගල ප්‍රාදේශිය සභාවට අයත් කඩ කාමර වලින් අයවීමට ඇති ඉදිකිරීම් ගාස්තු ,ප්‍රධාන මුදල් සහ හිඟ බදු මුදල් සම්බන්ධ පහත සඳහන් තොරතුරු සම්බන්ධයෙන් සභා තීරණය හා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

- නව තොග පොළ භූමියේ කඩ කාමර වල අය වීමට ඇති ප්‍රධාන මුදල් සහ හිඟ කඩ කුලී වල එකතුව - රු.4,494,213.00 (2022.06.30 දිනට)
- නව බස් නැවතුම්පළ නව කඩ කාමර 22 ට අදාලව අයවීමට ඇති ප්‍රධාන මුදල් සහ හිඟ කඩ කුලී වල එකතුව - රු.10,098,646.82 (2022.06.30 දිනට)
- 2021 සැප්තැම්බර් මස කඩා ඉවත් කරන ලද පළතුරු කුටිවල අය වීමට ඇති හිඟ මුදල - රු. 275,057.00 (2022.06.30 දිනට)
- නව බස් නැවතුම්පළ ගබඩා කඩ කාමර වල 2022.06:30 දිනට අය වීමට ඇති හිඟ මුදල රු.615,735.74
- අංක 03 ගවමස් කඩය 2022 6:30 දිනට අය වීමට ඇති හිඟ මුදල - රු.441,499.99

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ බොහෝ වේලාවක් සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම හිඟ කුලී අය වී නොමැති වීම මත ටෙන්ඩර් කොන්දේසි පවා කඩ වීමක් සිදු වී ඇති අතර ගිවිසුම් ප්‍රකාරව වහාම මෙම හිඟ මුදල් ගෙවා අවසන් කිරීමට කටයුතු කරන ලෙස බදුකරුවන්ට නැවතත් ලිඛිතව දන්වා යැවීමට කටයුතු කර මේ සම්බන්දයෙන් ආදායම් පරික්ෂකවරුන්ගේ සෘජු මැදිහත්වීමක් සිදු කර නිරන්තරව සොයා බලමින් මෙම හිඟ ආදායම් අය කර ගැනීමට මැදිහත් වන ලෙසත්, මෙම අවස්ථාවන්වලදී රටේ පවතින තත්ත්වයද සැලකිල්ලට ගනිමින් බදුකරුවන් විසින් යම් යම් අවස්ථාවන් වලදී ලබා දෙන අවම වාරික ප්‍රමාණය හෝ අය කර ගනිමින් කෙසේ හෝ මෙම හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවත්, එසේ කටයුතු කිරීමේදීද දිගින් දිගටම තව දුරටත් කුලී ගෙවීම පැහැර හරින වෙළඳසැල් හිමියන් සඳහා ගත යුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් ඉදිරියේදී නැවත සභා තීරණයක් ගෙන ක්‍රියාත්මක කරන තුරු සියලු හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කිරීමත්, ඒ වගේම මෙම හිඟ අතරින් කඩා ඉවත් කරන ලද පළතුරු කුටි වලින් අයවීමට ඇති සියලු හිඟ මුදල් මෙම වෙළඳකුටි කඩා ඉවත් කිරීම නිසාත්, ඔවුන්ට විකල්ප ස්ථාන ලබා නොදුන් නිසාත්, එම වෙළඳ කුටි ඉදිරියට පවත්වාගෙන නොගිය නිසාත්, යන කාරණා පදනම් කර ගනිමින් පළතුරු කුටිවලින් පමණක් අයවීමට ඇති හිඟ මුදල් නැවත එම හිමිකරුවන්ගෙන් අය කර ගැනීම අසාධාරණ කටයුත්තක් බැවින්, පළතුරු කුටිවලින් අයවීමට ඇති හිඟ මුදල් පමණක් ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ගිණුමෙන් කපා හැරීමට පියවර ගැනීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 06**

2021 වර්ෂය රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා තිබූ කාල සීමාවට අදාළව බදු මුදල් අඩුකර දෙන ලෙස වෙළඳසැල් බදු කරුවන් විසින් කරන ලද ඉල්ලීම් වලට අනුව 2021 වර්ෂයේ මැයි සහ ජුනි මාස වලට අදාල බදු මුදල් එම බදු කරුවන්ගෙන් අය නොකර සිටීමට 2021.08. 24 දින පැවති මහ සභාවේ දී අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව 2021 වර්ෂයේ මැයි සහ ජුනි මාස වලට අදාලව පහතින් දක්වා ඇති බදු කරුවන් වෙත ලබා දෙන ලද බදු සහන මුදල් ගිණුමෙන් කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීම සඳහාත් මහා සභාවේ සභා තීරණය හා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

| අනු අංකය | වෙළඳසැල | **2021 වර්ෂයේ මැයි සහ ජුනි මාස දෙකට අදාලව ගිණුමෙන් කපා හැරීම සඳහා ඉදිරිපත් කරන මුදල** |
|---|---|---|
| 01 | නව බස් නැවතුම්පළ කඩ කාමර | රු.660,980,00 |
| 02 | පලතුරු කඩ | රු.74,250.00 |
| 03 | ගඟබඩ කඩ කාමර | රු.160,800.00 |
| 04 | පොදු වෙළඳපොල විවෘත කඩ කාමර | රු.55,229.40 |
| 05 | නව වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර | රු.294,500.00 |
| 06 | නව තොග පොළ භූමියේ කඩ කාමර | රු.78,650.00 |
| 07 | මාලු කඩ | රු.99,499.96 |

| | | |
|---|---|---|
| 08 | අංක 03 ගවමස් කඩය | රු.232,500.00 |
| | **එකතුව** | **රු.1,656,409.36** |

එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කොරෝනා වසංගත කාල සීමාව තුළදී මෙසේ බදු සහන ලබා දුන් මුදල් ගිණුමෙන් කපා හැරීම සුදුසු බැවින් මෙයට අදාල තොරතුරු සියල්ල ගරු ආණ්ඩුකාර තුමන් වෙත ඉදිරිපත් කර ඒ අනුව ඉදිරි කටයුතු කිරීම  සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 07**

මොනරාගල ප්‍රාදේශිය සභාවට අයත් වාහන සඳහා ඇණවුම් මගින් ඉන්ධන ලබා දීම තාවකාලිකව අත්හිටුවා ඇති බව ඉන්ධන පිරවුම්හල් මගින් දන්වා ඇති බැවින් ආයතනයේ වාහන සඳහා අත්පිට මුදලට ඉන්ධන ලබා ගැනීමට සිදුවී ඇති අතර දැනට කාර්යාලය මගින් රුපියල් ලක්ෂයක මුදලක් මේ සඳහා අත්තිකාරමක් වශයෙන් ලබාගන්නා අතර එම මුදල කාර්යාලයේ වාහන ප්‍රමාණය හා පවතින ඉන්ධන මිල අනුව ප්‍රමාණවත් නොවන බැවින් අත්තිකාරම් මුදල රුපියල් ලක්ෂ 03 දක්වා වැඩි කර ලබා ගැනීම සඳහා මහා සභාවේ සභා තීරණය හා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී සභාවේ ඇති වූ සාකච්ඡාවන්ගෙන් අනතුරුව වර්ථමාන රටේ පවතින තත්ත්වය හමුවේ ඉන්ධන ඇණවුම් සඳහා ඉන්ධන පිරවුම්හල් වලින් මේවන විට ඉන්ධන නිකුත් කිරීම නතර කර ඇති බැවින් අත් පිට මුදලට ඉන්ධන මිල දී ගැනීමට සිදු වී ඇති බවත්, ඒ අනුව මෝටර් ග්‍රේඩර්යට  මෙන්ම බැකෝලෝඩර්යට මේ වන විට ඉන්ධන ලීටර් 50 බැගින් ලබා දෙන අතර එම ප්‍රමාණය පැය 06 ක් පමණ වැඩ කළ පසු අවසන් වන අතර මෙම තත්ත්වය ගැටලු සහගත  තත්ත්වයක් බවත්,දැනට ආයතනයේ ධාවන තත්ත්වයේ පවතින වාහන සහ යන්ත්‍රෝපකරණ 15 ක් පමණ ඇති අතර  ඊට අමතරවද විදුලි ජනක යන්ත්‍රය,තණකොල කපන යන්ත්‍ර කිහිපයක්ද ඇති බැවින් මෙම සියලු වාහන සහ යන්ත්‍රෝපකරණ වලින් අඛණ්ඩ මහජන සේවාවක් පවත්වාගෙන යන බැවින් නිරන්තරව ඉන්ධන ලබා ගැනීමට අවශ්‍ය වන බව ගරු සභාපතිතුමන් සඳහන් කර සිටි අතර මුල් අවස්තාවන් වලදී මෙවැනි තත්ත්වයන් සඳහා පළාත් පාලන කොමසාරිස් තුමන් විසින් රු.50000.00 ක අත්තිකාරම් මුදලකට යටත්ව ඉන්ධන ලබා ගැනීමට අවසර ලබා දී තිබුනද පසුව එය ප්‍රමාණවත් නොවූ බැවින් රු.100,000.00 දක්වා වැඩි කර අත්තිකාරම් මුදල් ලබා ගත්තද වර්ථමානයේ පවතින ඉන්ධන ගැටලුවත් ඉන්ධන වල මිල අධිකව ඉහල යාමත් හේතුවෙන් මෙම ලබා ගත් අත්තිකාරම් මුදල ප්‍රමාණවත් නොවීම මත විශාල ගැටලුවකට මුහුණ පා සිටින බැවින් මෙම අත්තිකාරම් මුදල රු.ලක්ෂ

තුන දක්වා (රු.300,000.00) වැඩි කර ගැනීම අත්‍යාවශ්‍ය බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

වර්ථමාන රටේ පවතින ඉන්ධන ගැටලුව හමුවේ මෙම යෝජනාවට අදාලව ගරු සභාපතිතුමන් විසින් කළ පැහැදිලි කිරීමත් සමඟ මෙම සාධාරණ හේතු කාරණා පදනම් කර ගනිමින් ආයතනයේ සියලු වාහන හා යන්ත්‍ර සූත්‍රවලට අත්පිට මුදලයට ඉන්ධන ලබා ගැනීම සඳහා රුපියල් ලක්ෂ තුනක අත්තිකාරම් මුදලක් සභා අරමුදලින් ලබා ගැනීම සුදුසු බවත්,මේ සඳහා පළාත් පාලන කොමසාරිස් තුමන්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 08**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් වාහන, යන්ත්‍රෝපකරණ සඳහා පහත විස්තර සඳහන් අමතර කොටස් ලබා ගැනීම, අළුත්වැඩියාවන් සිදු කිරීම ආදී කටයුතු සඳහා වැය වන මුදල් සභා අරමුදලින් ගෙවීම් කිරීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

| අනු අක | වාහන අංකය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 01 | Pf-7419 | කැබ් රථයේ වාර සේවාව සහ බ්‍රේක් පෑඩ් දැමීම | 105,311.00 |
| 02 | 252-6330 | කැබ් රථයේ වාර සේවා සිදු කිරීම | 34,020.00 |
| 03 | RS-1800 | ටයර් පැච් දෙකක් දැමීම | 2400.00 |
| 04 | ZA 5061 | බැකෝ ලෝඩරයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම | 405,561.96 |
| 05 | ZA 5061 | බැකෝ ලෝඩරයේ අලුත්වැඩියාවට අමතර කොටස් මිලදී ගැනීම | 21,000.00 |
| 06 | ZA 5061 | බැකෝ ලෝඩරයේ පසුපස වම් ස්විමිං ජැක් එක අලුතින් දැමීම | 368,180.51 |
| 07 | LL-7682 | කෘෂ කැබ් රථයේ 650 * 16 ටයර් එකක් දැමීම | 44,690.00 |
| 08 | LL-7682 | කෘෂ කැබ් රථයේ ෆෑන් බෙල්ට් එක හා A/C බෙල්ට් මිලදී ගැනීම | 7550.00 |
| 09 | LL-7682 | කෘෂ කැබ් රථයේ ෆෑන් බෙල්ට් හා A/C බෙල්ට් බ්‍රේක් ලීවර් අලුත්වැඩියා සඳහා වැඩ කුලිය ගෙවීම | 4200.00 |
| 10 | LM-3078 | ගලි රථයේ 825* 16 ටියුබ් එකක් හා ටයර් මාරු කිරීම | 7250.00 |
| 11 | LM-3078 | ගලි රථයේ ක්ලච් පොම්පයේ රෙපෙයාර් කිට් ටික දැමීම සඳහා ටැංකිය අලුත්වැඩියා කිරීම | 19,700.00 |
| 12 | LM-3078 | නැවත පිරවූ ටයර් දෙකක් දැමීම සඳහා වැඩ කුලිය | 2000.00 |

| | | | |
|---|---|---|---|
| 13 | LN-7508 | ගලි රථයේ සයිරන් නලාව අලුත්වැඩියා කිරීම | 11,700.00 |
| 14 | RC-1112 | ට්‍රැක්ටර් රථයේ ක්ලච් ප්ලේට් එකෙහි අලුත් අලුත්වැඩියාව | 32,900.00 |
| 15 | RD-4488 | ට්‍රැක්ටර් රථයේ 600* 16 ටියුබ් එකක් හා ටයර් මාරු කිරීම | 4500.00 |
| 16 | RD-4488 | මෝටරේ අලුත්වැඩියා කටයුතු සඳහා ගෙවීම | 7300.00 |
| 17 | 49-5301 | ටොප් ටාෆ්ට් එකේ අලුත්වැඩියා සඳහා අමතර කොටස් මිලදී ගැනීම | 4670.00 |
| 18 | 49-5301 | ටොප් ටාෆ්ට් එකේ අලුත්වැඩියාව, කෙට් ඇති තැන් ලියවීම, මෙන්ම ටාෆ්ට් එක බ්‍රෝන්ස් වලින් ලියවීම | 35,500.00 |
| 19 | 49-5301 | ටොප් ටාෆ්ට් එකේ අලුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් යොදා සකස් කරීම | 27,500.00 |
| 20 | 49-5301 | ඔයිල් ෆිල්ටරයක් හා ඔයිල් 03L ක් දැමීම | 7140.00 |
| 21 | GN-1548 | ට්‍රේලරයේ කටවල් ලියවීම,තහඩුව ගැසීම,පිටුපස දොරසහ පින් දෙක සකස් කිරීම | 34550.00 |

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

අදාල පරීක්ෂණ වාර්තාවන්ට අනුව ඉදිරිපත් කර ඇති මෙම වාහන අලුත්වැඩියා කටයුතු සහ අමතර කොටස් යෙදීම, වාර සේවා කටයුතු සුදුසු පරිදි විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 09**

පසු ගිය දිනවල ආයතනය සඳහා මිලදී ගනු ලැබූ පහත සඳහන් අත්‍යවශ්‍ය මිලදී ගැනීම් සඳහා මහ සභාවේ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

- මාර්ග අංශය සඳහා අතින් තල්ලු කර ක්‍රියාත්මක කරවන තණකොළ කපන යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම
- තෙල් ගබඩා කිරීමට 1000L ටැංකියක් මිලදී ගැනීම
- විදුලි අංශය සඳහා අවශ්‍ය වයර් රෝල් 15 ක් මිලදී ගැනීම
- ආයතනයට අවශ්‍ය ප්‍රින්ටර් දෙකක් මිල දී ගැනීම
- ආදාහනාගාරයට අවශ්‍ය ගෑස් සිලින්ඩර 09 නැවත පිරවීම
- සර්ජිකල් මාක්ස් 3000 ක් මිල දී ගැනීම

- අත් ග්ලවුස් 700 ක් මිල දී ගැනීම
- වර්ණ සහිත ඡායා පිටපත් (පාට A/4) බණ්ඩල් 05 ක් මිලදී ගැනීම
- ඩෙටොල් බෝතල් 05 ක් (1L) මිලදී ගැනීම
- KN 95 මාක්ස් 200 ක් මිලදී ගැනීම
- ලයිෆ්බෝයි සබන් කැට 200 ක් මිල දී ගැනීම

එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්යාලයට අත්‍යාවශ්‍ය මෙම මිල දී ගැනීම් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මිල දී ගැනීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 10**

මොනරාගල නගරය ආශ්‍රිතව පහත සඳහන් අත්‍යාවශ්‍ය සංවර්ධන හා නඩත්තු කටයුතු සිදු කළ යුතු බැවින්, සභා අරමුදලින් මෙම සංවර්ධන කටයුතු ඉටු කිරීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

I. මොනරාගල සිරිගල දිස්ත්‍රික් රෝහල ඉදිරිපිට ගිමන්හලට යාබදව මගීන් විවේකීව ගත කරන ස්ථාන වල කුට්ටිගල් අතුරා කොන්ක්‍රීට් බංකු සවි කිරීම
II. මොනරාගල හොරොම්බුව ප්‍රදේශයේ ඇති පැරනි සහ නව සුසාන භූමිවල ආරක්ෂිත කටු කම්බි වැට ඉදිකිරීම
III. මොනරාගල පොදු සුසානභූමියේ ඉදිරිපස අබලන් තාප්පය අලුත්වැඩියා කර සංවර්ධනය කිරීම
IV. මොනරාගල විහාරමුල්ල හූටාගොල්ල සුසාන භූමිවල ආරක්ෂිත කටු කම්බි වැට ඉදිකිරීම.

මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

ඒ වගේම න්‍යාය පත්‍රයට ඇතුලත් කර නොතිබුණද මෙම යෝජනා යටතේම අත්‍යාවශ්‍යම සංවර්ධන යෝජනාවක් වන හුලංදාව බිබිල මාර්ගයේ ශරීර සුවතා මධ්‍යස්ථානයේ ඇති ගොඩනැගිල්ලේ උඩු මහලේ ආරක්ෂිත දැල් වැටක් නොමැති නිසා සතුන්ට මෙන්ම බාහිර පුද්ගලයින්ට පවා ඇතුලත් වීමට පවතින ඉඩ කඩ වැඩි අතර මෙමගින් අනවශ්‍ය ගැටලුවලට මුහුණ දිය හැකි බැවින් මෙම උඩු මහල වටා ආරක්ෂිත දැල් වැටක් ගැසීම සඳහාද මේ සමඟම සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් නැවත යෝජනා කර සිටින ලදි.

මෙහි උඩු මහල වටා ආරක්ෂිත දැල් වැටක් ගැසීම හෙල බොජුන් හලක් ආරම්භ කිරීම වෙනුවෙන්ද අත්‍යාවශ්‍යම කාරණාවක් වන බැවින් මෙම යෝජනාවද ක්‍රියාත්මක කිරීම සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනා සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනා සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

රටේ පවතින තත්ත්වය සම්බන්ධයෙන් සහ පළාත් පාලන කොමසාරිස් තුමන් විසින් ලබා දී ඇති උපදෙස් මෙන්ම අදාල චක්‍රලේඛ ද පදනම් කර ගනිමින් සහා අරමුදල් ප්‍රමාණවත් පරිදි පවතින අවස්ථාවන් වලදී ප්‍රාදේශීය සභා මට්ටමින් සිදු කළ යුතු මෙම අත්‍යාවශ්‍ය සංවර්ධන යෝජනා විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කිරීම සුදුසු බවටත්, ඒ වගේම හුලංදාව බිබිල මාර්ගයේ ශරීර සුවතා මධ්‍යස්ථානයේ ඇති ගොඩනැගිල්ලේ උඩු මහලේ ආරක්ෂිත දැල් වැටක් ඉදිකිරීම සුදුසු බවටත්, සභාව ඒකමතිකව අනුමත කරන ලදී. ඒ වගේම බල ප්‍රදේශය පුරාවට පවතින සියලුම සුසාන භූමි මායිම් වැටවල් සකස් කර පවතින කැළෑවන් සුද්ද කර පවත්වාගෙන යාම සඳහාද අවධානය යොමු කළ යුතු බවද සභාව තීරණය කර සිටින ලදි.

**යෝජනා අංක 11**

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ කාර්ය සාධන ව්‍යාපෘති 2 අදියර යටතේ රුපියල් මිලියන 5 ක මුදලක් වෙන් කරන ලද මොණරාගල නගරයේ නව බස්නැවතුම් පොළ භූමියේ කිලෝ වොට් 40 ක ධාරිතාවයකින් යුත් සූර්ය පැනල පද්ධතියක් සවි කිරීමේ ව්‍යාපෘතිය වර්තමානයේ රටේ පවතින තත්වය මත සිදු කිරීමට අපහසු වී ඇති බැවින් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් දන්වා ඇති අතර ඒ වෙනුවට මොණරාගල ප්‍රාදේශිය සභාවට අයත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකර ඇති ගුරු පුහුණු මධ්‍යස්ථානයේ උඩුමහල ඉදිකර දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා සහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට වයි.උපුල් ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියට අයත් කාර්ය සාධන ව්‍යාපෘති 2 අදියරය යටතේ තෝරාගෙන තිබූ නගරයේ සූර්ය පැනල පද්ධතිය සවි කිරීමේ ව්‍යාපෘතිය පවතින තත්ත්වයන් හමුවේ සිදු කිරීම අපහසු බවට අදාළ ව්‍යාපෘති අධ්‍යක්ෂක දන්වා ඇත්නම් එම ප්‍රතිපාදන යටතේ ඒ හා සමාන කාලින වශයෙන් වටිනාකමක් පවතින ප්‍රාදේශිය සභාවට අයත් නගරයේ පවත්වාගෙන යනු ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකර ඇති ගුරු පුහුණු මධ්‍යස්ථානයේ උඩු මහල ඉදිකර එහි දිවා සුරකුම් මධ්‍යස්ථානයක් ආරම්භ කර සේවාවක් සැපයිය හැකි පරිදි පහසුකම් සහිත ආරක්ෂාව පවතින ආකාරයට විධිමත්ව ඉදිකර පවත්වාගෙන යාම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 12**

පසු ගිය මහ සභා වාර දෙකකදී පමණ ගරු මන්ත්‍රීවරුන් විසින්ම සාකච්ඡා කර ගත් පරිදි රටේ පවතින තත්ත්වයට සමගාමීව මොනරාගල බල ප්‍රදේශයේ සියලුම ග්‍රාමනිලධාරී වසම් නියෝජනය වන පරිදි තෝරා ගන්නා ලද පවුල් සඳහා ගෙවතු වගා ආරම්භ කිරීමේ වැඩසටහනක් දියත් කිරීම සඳහා මූලික අධියරය වශයෙන් බීජ ලබා දීමේ ක්‍රියාදාමය ඉටු කිරීම සඳහා සහා අරමුදලින් මුදලක් තීරණය කර වෙන් කිරීම හා ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා සහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මේ සම්බන්ධයෙන් සභාවේ දීර්ඝ වශයෙන් විවිධ අදහස් හා සාකච්ඡාවන් ඇති විය.

මෙහිදී සභාවේ සාකච්ඡා වූ පරිදී මෙම බීජ වශයෙන් බණ්ඩක්කා, මිරිස්, වම්බටු, දඹල, මෑ කරල් පතෝල, වැටකොළු යන බීජ වර්ග වලින් වර්ග 5ක් මිලදී ගැනීම සුදුසු බවට සභාවේ තීරණය විය.

එහිදී ගරු උපසභාපතිතුමා විසින් තම කොට්ඨාශයේ ගොවීන්හට මෙම බීජ ඕනෑ තරම් වගා කිරීමට ඇති බැවින්, හැකියාවක් පවතීනම් නයි මිරිස් බීජ තම කොට්ඨාශයේ ජනතාවට ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා ස්ථිර කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් මීට පෙර සභාවාර වලදීද සාකච්ඡා කර ගත් පරිදි මේ සඳහා බීජ මිළදී ගැනීමට සුදුසු ස්ථානයකින් කිලෝ ගාණට බීජ වර්ග 05 ක් මිලදී ගෙන සෑම ග්‍රාම නිලධාරී වසමකටම වර්ග 5 බැගින්, කුඩා පැකට් 5ක් වැලක් ආකාරයට සකස් කර එක් පවුලකට එක් වැලක් වන සේ ප්‍රාදේශීය සභාවේ නම යෙදූ කුඩා ලේබලයක්ද සහිතව කොට්ඨාශ භාර සියලුම සභිකවරුන් වෙත ලබා දීම සුදුසු බවත්, ඒ වගේම ගරු උප සභාපතිතුමාගේ ඉල්ලීමට අනුව එතුමන්ගේ කොට්ඨාශයට නයි මිරිස් බීජ ලබා දීමට හැකියාවක් පවතින්නේනම් එම බීජද පැකට් 200ක් ලෙස සකස් කර ලබා දීම සුදුසු බවත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී. ඒ වගේම මෙම මිලදී ගැනීම ප්‍රමිතියෙන් යුත් උසස් බීජ මිලදී ගැනීමට කටයුතු කිරීම සුදුසු බවත්, මේ සඳහා වැය වන මුදල් සභා අරමුදලින් දැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් වැඩ පිළිවෙලක් යටතේ බීජ බෙදා දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 13**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් වාහන වල 2022 වර්ෂයට අදාල රක්ෂණ කටයුතු සඳහා ආයතන තුනකින් මිල ගණන් පහත සඳහන් කර ඇති පරිදි ලබා දී ඇති බැවින් (මෙම ආයතන 03 හිම මිල ගණන් මෙන්ම එම ආයතන වලින් වෙන් වෙන් වශයෙන් සලසන පහසුකම්ද වෙන් වෙන්ව ලබා දී ඇත) ඒ සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

| වාහන අංකය | වාහන වර්ගය | වටිනාකම | ජාතික රක්ෂණ භාර අරමුදල | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | සෙලින්කෝ රක්ෂන සමාගම |
|---|---|---|---|---|---|
| 252-6330 | ඩබල් කැබ් රථය | 1,500,000.00 | 10,659.00 | 14,662.96 | 44,483.62 |

| | | | | | |
|---|---|---|---|---|---|
| PF-7419 | ඩබල් කැබ් රථය | 6,390,000.00 | 36,409.26 | 53,003.06 | 74,789.81 |
| LL 7682 | කෘ කැබ් රථය | 3,232,282.00 | 19,099.90 | 28,244.89 | 68,134.99 |
| LL 6980 | ට්‍රක් රථය | 6,009,602.00 | 33,694.49 | 54,109.82 | 30,643.18 |
| ZA-5061 | බැකෝ ලෝඩරය | 17,649,179.00 | 52,000.00 | 52,828.56 | 128,929.17 |
| LF -2698 | ගලි බවුසරය | 2,000,000.00 | 11,154.33 | 14,258.77 | 33,525.75 |
| LM -3078 | ගලි බවුසරය | 8,675,000.00 | 51,858.68 | 54,053.25 | 120,128.01 |
| LN-7508 | ගලි බවුසරය | 10,235,000.00 | 59,529.28 | 63,353.03 | 111,387.27 |
| 37-9430 | ට්‍රැක්ටර් රථය | 400,000.00 | 3,071.67 | 4,647.43 | 7,660.79 |
| 49-5301 | ට්‍රැක්ටර් රථය | 650,000.00 | 4,965.17 | 6,105.27 | 9,410.24 |
| RC-1112 | ට්‍රැක්ටර් රථය | 800,000.00 | 6,581.00 | 6,979.97 | 10,459.91 |
| RD-4488 | ට්‍රැක්ටර් රථය | 1,350,000.00 | 9,773.56 | 10,187.21 | 14,308.70 |
| RD-9406 | ට්‍රැක්ටර් රථය | 2,655,318.00 | 10,111.70 | 11,967.62 | 23,443.06 |
| GC-5148 | ගිනි නිවන රථය | 1,000,000.00 | 7,926.20 | 8,280.34 | 11,859.47 |
| | | | **316,834.24** | **382,682.18** | **689,163.97** |

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙහිදී මෙම රක්ෂණ සමාගම් නියෝජිතයින් යම් යම් අවස්ථාවලදී ආයතනය වෙත පැමිණ ඔවුන්ගේ රක්ෂණ සමාගම් වෙතින් රක්ෂණ කටයුතු වලදී ලබා දෙනු ලබන ප්‍රතිලාභ පිළිබඳව අදහස් ඉදිරිපත් කරමින් අප වෙත ලිපි ඉදිරිපත් කර ඇති අතර, මෙම රක්ෂණ සමාගම් වලින් ලබා දෙනු ලබන ප්‍රතිලාභ විවිධාකාරයෙන් ඇති බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදී. ඉන් අනතුරුව මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

අදාළ වාහනය ද වාහනයේ ගමන් ගන්නා රියදුරුද ඇතුළු අනෙකුත් අයද මෙම රක්ෂණාවරනයට ඇතුලත් විය යුතු අතර ඊට අමතරවද පූර්ණ රක්ෂණාවරනයකදී ගෙවනු ලබන සියලුම ප්‍රතිලාභ වරප්‍රසාද හා ආවරණයන්ට යටත්ව ඉහත රක්ෂණ ආයතන තුනෙන් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති රක්ෂණ ආයතනයෙන් මෙම වාහන සඳහා වන රක්ෂණ කටයුතු විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කිරීම සුදුසු බවටත්, මේ අතරින් මිල ගණන් වෙනස් වන වාහන වර්ග වල පමණක් ඒ සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති රක්ෂණ ආයතනවලින් ඉහත සියලුම වරප්‍රසාද , ප්‍රතිලාභ ආවරණයන්ට යටත්ව අදාල රක්ෂණ කටයුතු විධිමත්ව සිදු කිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 05.2 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චාමර නානායක්කාර මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව

**යෝජනා අංක 01**

නක්කල කොට්ඨාශයේ පහත සඳහන් අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සහා අරමුදලින් ඉටු කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රී තුමන් විසින් සභාවට යෝජනා කර සිටින ලදි.

01. අලකොලමණ්ඩිය මාර්ගය බෝක්කුව ඉදිකිරීම
02. යොවුන් ගම්මානය-මිල්ලකැලේ බෝක්කුව ඉදිකිරීම
03. අමුණුදෝව - 22 කණුව විහාර මාවත බෝක්කුව ඉදිකිරීම
04. කිරිගම්මානය අමුණුදෝව මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම
05. දෙහිකිඳගම පාසල් මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම
06. . නිල්ගහආරාව මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම
07. මල්ආරවත්ත මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම
08. කරවිලඇල්ල මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම
09. දෙහිකිඳගම පාසල් මාර්ගය - බකිණිලන්ද මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.
මෙම සියලු සංවර්ධන යෝජනා ඉටු කිරීමට හැකියාවක් පවතින්නේද යන්න සොයා බලා තීරණය කර කොමසාරිස්තුමන් විසින්ද ලබා දී ඇති උපදෙස් ද රාජ්‍ය මුදල් පාලන චක්‍ර ලේඛය ද පදනම් කර ගනිමින් මෙම අත්‍යාවශ්‍ය යෝජනා සහා අරමුදල් ප්‍රමාණවත්ව පවතින අවස්ථාවන් වලදී ක්‍රියාත්මක කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 05.3 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.ගුණවර්ධන මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව

**යෝජනා අංක 01**

වෙහෙරගල ග්‍රාම නිලධාරී වසමේ කළු දිය ඇල්ල ගොවි ගම්මාන මාර්ගයේ ස්ථාන දෙකක් සඳහා ප්‍රදේශවාසීන්ගේ ශ්‍රමදාන මට්ටමින් ඉදිකර ගැනීමට බෝක්කු දෙකක් සඳහා කොන්ක්‍රීට් සිලින්ඩර් 04 ක් (දිග අඩි08 යි උස අඩි 02 යි වශයෙන්) ලබා දීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රී තුමන් විසින් සභාවට යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙහිදී මෙවැනි සංවර්ධන යෝජනා ගම් මට්ටමින් පවතීනම් ඒවා සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලෙසත් බෝක්කු ඉදිකිරීම් සඳහා අවශ්‍ය වන සහයෝගයන් ඕනෑම අවස්ථාවක ලබා දිය හැකි බවටත් ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ශ්‍රම දායකත්වයෙන් මෙම සංවර්ධන කටයුතු සිදු කරන බැවින්, මෙම යෝජනාවට අදාළ කොන්ක්‍රීට් සිලින්ඩර් 4 ලබා දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 06. ආදායම් වියදම් වාර්තාව සහා සම්මත කිරීම

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සහා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2022.07.01 දින සිට 2022.07.30 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ සහ රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ විරෝධතාවයන් ද නොමැතිවූ බැවින්, පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. කමිටු වාර්තා සලකා බැලීම

ඉදිරිපත් වී නොමැත

## 08. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරිම බැවින්,වෙනත් කරුණු සමඟම සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදි.

### 08.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - රමණී රත්නායක මැතිතුමිය

I. අවසර ගැනීමෙන් අනතුරුව පසු ගිය මාස දෙක තුන තුළ දැවැන්ත ආගාධයකට රට පත් වූ මොහොතක දැඩි වගකීමක් සහිතව රට භාරගත් නව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ට සුභාශිංසනය ගෙන එන බවත් ඒ වගේම පහුගිය දිනවල රට තුළ නිර්මාණය වූ සියලු පෝලිම් ක්‍රම හා ජනතාව මුහුණ දුන් දැඩි පීඩාකාරී තත්ත්වයන් ඇතුළුව සියලුම ප්‍රශ්න තුරන් වී ජනතාවගේ කඳුල නිමාකර මුවගට සිනහවක් ලබාදිය හැකි වන පරිදි රටේ කටයුතු සාමාන්‍ය පරිදි යථා තත්ත්වයට ගෙන ඒමට කටයුතු කිරීමට නව ජනාධිපතිතුමන්ට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ගරු මන්ත්‍රීතුමිය සඳහන් කර සිටින ලදි.

II. ඒ වගේම පහුගිය කාලය තුල විශ්ව විද්‍යාල වල තරුණ සිසුන් එකතු වී සිදු කළ දැවැන්ත අරගල හමුවේ හිටපු ජනාධිපතිතුමාටත් අගමැතිතුමාටත් රජයෙන් ඉල්ලා අස්වීමට සිදු වූ අතර මෙම සිසුන් විසින් ඉතා සාධාරණව පවත්වාගෙන ගිය සාමකාමී අරගල වෙනස් මගකට ගෙන යාම තුළින් රට තුළ විවිධ ප්‍රශ්න රාශියක් ඇති කරවීමේ උනන්දුවකින් කටයුතු කළ ඇතැම් පිරිසකගේ නොමනා ක්‍රියාකාරී හැසිරීම් තුළ රටේ දැවැන්ත ලෙස ගැටලු රාශියක් නිර්මාණය වීමට හේතු වූ බව ගරු මන්ත්‍රීතුමිය සඳහන් කර සිටින ලදි.

III. ඒ වගේම රට ගොඩ ගැනීමේ ක්‍රියාවලිය සඳහා බලධාරීන් මෙන්ම වග කිව යුතු සියලු පිරිස් විසින් මාධ්‍යයන් හරහා සිදු කරනු ලබන විවිධ ප්‍රකාශයන් මාධ්‍යයට පමණක් සීමා නොකර ඒවා ක්‍රියාත්මක කරමින් රට යථා තත්ත්වයට ගෙන ආ යුතු බවත්, ඒ වගේම කිසිදු පක්ෂ පාට භේදයකින් තොරව ඔබ අපි සියලු දෙනාම නැගී සිටිමින් මෙම දැවැන්ත ක්‍රියාදාමය වෙනුවෙන් උපරිම දායකත්වය, සහයෝගය ලබා දිය යුතු බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමිය සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- පසු ගිය දින වල රට තුළ පැවති අරගල වලට මුවා වී ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරීමෙන් බොහෝ පිරිසක් විසින් මහා අපරාධ සිදු කළ අතර විශේෂයෙන්ම අරලියගහ මන්දිරය, ජනාධිපති මන්දිරය ආදී රටක ගෞරවය පවතින ස්ථානවල ඒ ගරුත්වය මෙම පිරිස් විසින් බිමට හෙලා දැමූ අතර ඔවුන්ට නීතිය මගින් නිසි දඬුවම් ලැබිය යුතු බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි. ඒ වගේම ඒ මොහොතේ ගරු ජනාධිපතිතුමන් විසින් රට ගැන සහ රටේ ජනතාව ගැන හිතා රටින් පිටවීමට කටයුතු කළ අතර කෙසේ වෙතත් රටේ යුද්ධය අවසන් කිරීමට පූර්ණ දායකත්වයක් දැක්වූ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් ලංකාවේ ජීවත් විය යුතුම පුද්ගලයෙක් වශයෙන් ගරු කළ යුතු බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටි අතර මෙවැනි මොහොතක රටේ වගකීම බාරගෙන කටයුතු කිරීම සම්බන්ධව රනිල් වික්‍රමසිංහ ගරු ජනාධිපති තුමන්ට අපි කවුරුත් සුභාශිංශනය ගෙන එන බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

## 08.2 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ගුණවර්ධන මැතිතුමා</u>

I. අවසර ගැනීමෙන් අනතුරුව ප්‍රදේශයේ ගොවි ජනතාව වෙනුවෙන් කතා කළ යුතු මේ මොහොතේ ප්‍රදේශයේ ජනතාවගෙන් බහුතරයක්ම හේන් ගොවිතැන් කර ජීවත්වන අතර, ඒ අතරින් බඩ ඉරිඟු වගාව විශේෂ තැනක් ගන්නා අතර, පසු ගිය වර්ෂ වල මෙම ගොවීන් විසින් තම විය හියදම් මෙන්ම තම දූවා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වල විය හියදම් ද ගැටලුවකින් තොරව සිදු කර ගත් අතර පසු ගිය වර්ෂයේ පැවති පොහොර ගැටළුවත් සමග අස්වැන්න නිසි පරිදී සිදු කර ගැනීමට නොහැකි වූ බැවින් මෙම ගොවීන් මහත් අසරණ තත්ත්වයට පත් වූ අතර, ඒ වගේම වෙළඳ පොළේ බඩු භාණ්ඩ වලද අධික ලෙස මිළ ඉහල යාමත් බඩ ඉරිඟු පැකට් එකක් අද වනවිට රු.18,000.00 වැනි මුදලක් වන අතර ඒ වගේම වට්ටක්කා බීජ ටින් එකක් රු.15,000/-ක පමණ අධික ලෙස මිල වැඩිවීමත් සමග, ඒ වගේම වගා බිම් සකස් කිරීම සඳහා යොදවා ගනු ලබන වාහනය, යන්ත්‍ර සූත්‍ර වලට අධික වැඩ කුලීයක් ගෙවීමටද සිදුව ඇති නිසාත් යනාදී කරනාවන් හේතුවෙන් බොහෝ පිරිසක් වගා කටයුතු වලින් ඈත් වී ඇති බවට ගරු මන්ත්‍රීතුමන් සඳහන් කර සිටින ලදි.

II. ඒ වගේම මෙම ගොවීන් මුහුණ දී ඇති මෙම සියලු ප්‍රශ්නවලට විසඳුම් ලබාදීම සඳහා රජය විසින් කඩිනම් වැඩපිළිවෙලක් සකස් කළ යුතු බැවින් මෙසේ විසඳුම් ලබා දෙන තුරු ප්‍රාදේශීය සභා බල තල ප්‍රකාරව ප්‍රදේශයේ ගොවි ජනතාවට අවශ්‍ය බීජ ටික පොහොර ටික ආදී දේවල් ලබා දී සහනයක් ගෙන දිය හැකි ක්‍රමවේදයක් දියත් කර මේ සඳහා දායක වීමට හැකියාවක් පවතින්නේනම් ගොවීන්ගේ බලාපොරොත්තු නැවත ඉටුවන බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටි අතර මේ සම්බන්ධයෙන් කාරුණික අවධානය යොමුකර මැදිහත් වී ඉහළ නිලධාරීන්ට ද දැනුම් දී යම් කිසි සහයෝගයක් ප්‍රදේශයේ ගොවි ජනතාවට ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රී තුමන් සඳහන් කර සිටින ලදි.

III. ඒ වගේම රටේ පවතින දැවැන්ත ආර්ථික ප්‍රශ්නය මෙන්ම ඉදිරි නියං සහිත කාලගුණික තත්ත්වයන් හමුවේ දුප්පත් ජනතාව ඉතාමත් අසරණ තත්ත්වයකට පත්ව වන බැවින් ප්‍රාදේශීය සභාවේ මැදිහත්වීමෙන් ප්‍රදේශයේ දුප්පත් ජනතාවට යම් ආකාරයකින් හෝ ආර්ථිකය පවත්වාගෙන යාමට උදව් උපකාරයක් කළ හැකි නම් මේ මොහොතේ එය ඉතාමත් වටිනා සත් ක්‍රියාවක් වන බැවින් ග්‍රාම සේවා වසම් මට්ටමින් පවුල් තෝරා බේරා ගෙන ගෙවතු වගා ඇති කිරීමට උනන්දු කරවීමත්, ඒ වගේම ප්‍රාදේශීය සභා මට්ටමින් සැපයිය හැකි සියලුම සහන ජනතාවට ලබා දීමට කටයුතු කරමු බවට ගරු මන්ත්‍රීතුමා සඳහන් කරමින් සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

- ඉන්ධන මිල ඉහළ යාමත් සමග යන්ත්‍රසූත්‍ර වල වැඩ කිරීමේ කුලී ගාස්තු වැඩිවීමක් සිදු වුවත් ලබන සතිය තුළ වන විට ඉන්ධන ප්‍රශ්නය විසඳෙන බැවින් මෙම ප්‍රශ්න යථා තත්ත්‍යට පත් වන බවත්, ඒ වගේම තෙනගල්ලන්ද ගොවීන්ගේ ඉඩම් ප්‍රශ්නයට විසඳුම් ලබා දීම සම්බන්ධයෙන් මේ වන විටත් අදාල අමාත්‍යවරුන් විසින් සාකච්ඡා කරමින් පවතින අතර ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපිට සිදු කළ හැකි උපරිම දායකත්වයක් ප්‍රදේශයේ ගොවි ජනතාව වෙනුවෙන් නිරන්තරවම ලබා දෙමු බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

## 08.3 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුනිල් අරංගල මැතිතුමා</u>

I. අවසර ගැනීමෙන් අනතුරුව මොනරාගල දිස්ත්‍රික්කයට විශාල අඩුවක්ව පැවති නගර සභාවක් පිහිටුවීම සම්බන්ධයෙන් නොයෙකුත් විරෝධතා, ගැටලු මැද ගරු සභාපතිතුමන්ගේ පූර්ණ මැදිහත්වීමෙන් පසුගිය ආණ්ඩු කාලයේ දිස්ත්‍රික් නායකවරයා ලෙස සිටි ශෂීන්ද්‍ර රාජපක්ෂ ගරු අමාත්‍යතුමා ඇතුළු පිරිසද රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා වශයෙන් සිටි රංජිත් මද්දුම බණ්ඩාර අමාත්‍යතුමන්ද ඇතුළු දිස්ත්‍රික්කය භාරව කටයුතු කළ ඉහළ දේශපාලන අධිකාරිය ඉතාමත් උනන්දුවෙන් කටයුතු කළ අතර, ප්‍රදේශයේ සංවර්ධනයටත් ජනතාවගේ සුභ සිද්ධිය සඳහාත් ඒ ගත්තාවූ උනන්දුව අද වනවිට මල් එල දරමින් පවතින අතර, මේ සඳහා ඇප කැප වී කටයුතු කළ සියලු දෙනාට ගෞරවණීය ස්තූතිය පුද කර සිටින බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ලදී.

II. ඒ වගේම පොහොර ප්‍රශ්ණය නිසා ගොවි ජනතාව අන්ත අසරණ තත්ත්වයකට පත් වී ඇති බවට කරන ප්‍රකාශයන් කොතෙක් දුරට සාධාරණය කළ හැකිද යන්න අවධානය යොමු කිරීමේදී වර්ථමානයේ අධික ලෙස ඉහළ ගොස් ඇති බඩු මිලත් සමඟ එයට සාපේක්ෂව සියලු ගොවි ජනතාවගේ නිෂ්පාදනයන් වැඩි මිල ගණන් යටතේ අලෙවි කරන බැවින් අනෙකුත් ව්‍යාපාරිකයින් මෙන්ම ගම්බද සියලු ගොවි ජනතාවද හොඳ ආදායමක් ලබා ගන්නා බැවින් ගුණවර්ධන මන්ත්‍රීතුමන් කියන ආකාරයට අපේ ගොවියන් අන්ත අසරණ වී නොමැති බවට ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

III. ඒ වගේම එදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් බහුතර සිංහල ජනතාවගේ ජනමතයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්වූ නායකයෙක් වශයෙන් එතුමන් සමග එතුමන්ගේ පත්වීමත් සමග රටේ සංවර්ධනය වෙනුවෙන් දැවැන්ත වැඩපිළිවෙළක් ආරම්භ කරමින් පැවති මොහොතක නොසිතූ අයුරින් පැමිණි කොරෝනා වසංගතය හේතුවෙන් ඒ සියලු දේ කණපිට හැරී රටේ ආර්ථිකය සම්පූර්ණ වශයෙන් කඩා වැටීමකට ලක් වූ බව ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටි අතර ඒ වගේම මේ කාලය තුළ විවිධ විකල්ප කණ්ඩායම් විසින් විශේෂයෙන්ම

ජනතා විමුක්ති පෙරමුණ ඇතුළුව සුළු ජාතිකයින් ද ඩයස්පෝරාව මෙන්ම යුරෝපා සංගම්, විවිධ බටහිර රටවල් වල විවිධ කණ්ඩායම් විසින් මෙවැනි දුර්වල අවස්ථාවක් පැමිණෙන තුරු බොහොම කල්පනාවෙන් බලා හිඳ කොරෝනා වසංගතයෙන් රටේ ආර්ථිකය කඩා වැටුණු මොහොතේ මරු පහරක් සේ හිඳිමින් මේ සියලු කණ්ඩායම් විසින් උපරිම ප්‍රයෝජනයක් ගෙන රටේ ජනාධිපති, ආරක්ෂක ලේකම් ,හමුදාපති යුද අපරාධකරුවන් ලෙස ලෝකය නම් කරද්දි රට අරාජික කරවීමට දැවැන්ත වැඩපිළිවෙළක් මෙම සියලු කණ්ඩායම් විසින් ගෙනගිය අතර රටේ විවිධ කණ්ඩායම් නිර්මාණය කරමින් අරගල මුවාවෙන් ඔවුන්ගේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරවීම තුළ රටේ තිබූ ආර්ථික අර්බුදය දේශපාලන අර්බුදයක් බවට පත් කරවමින් ගරු ජනාධිපතිතුමන් රටින් පිටුවහල් කරන තැනටම මොවුන් ක්‍රියාත්මක වූ බව ගරු මන්ත්‍රීතුමන් සඳහන් කර සිටි අතර මේ අවස්ථාවේ දී රටේ නායකත්වය භාර ගෙන ඉදිරි කටයුතු කර ගෙන යාමට සියලු පක්ෂවල නායකයින්ට අවස්ථාව ලබා දුන්න ද බහුතර නායකයින් විසින් වගකීම් භාර ගැනීමට ඇති බිය නිසා එම අවස්ථාවන් මග හරවා ගත් අතර අවසාන මොහොතේදී අයාලේ යන ආරාජික රටක් නිර්මාණය වීමට ප්‍රථම රනිල් වික්‍රමසිංහ මැතිතුමන් රටේ වගකීම භාරගෙන අද වන විට යම් ස්ථාවරත්වයක් දක්වා රට ගෙන එමින් පවතින බැවින් එතුමන්ට ගෞරවනීය ස්තුතිය පුද කර සිටින බව ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි.

IV. ඒ වගේම මෙවැනි අවස්ථාවක රටක් ජාතියක් වශයෙන් ඉදිරියට ගෙන යාමට පක්ෂ පාට භේදයකින් තොරව අපි කවුරුත් මේ මොහොතේ දායකත්වය සහ සහයෝගය දැක්විය යුතු බව ගරු මන්ත්‍රී තමා සඳහන් කර සිටි අතර ඒ වගේම ජනතාවගේ විවිධ කටයුතුවලදි බොහෝ රාජ්‍ය නිලධාරීන් ඉතාමත් ජරාවට, අල්ලසට කටයුතු කරන කණ්ඩායමක් බවට නිර්මාණය වී තිබීම රටේ අස්ථාවරත්වයට බෙහෙවින්ම බලපා ඇති කරුණක් වන අතර මෙවැනි බොහෝ අවස්ථාවන් වලදී මේවාට අවසන් වශයෙන් ඇඟිල්ල දික් වෙන්නේ මහජන නියෝජිතයින්ට වන අතර මෙම තත්ත්වයන් මකා දමන තාක් කල් මේ රට ගොඩ ගැනීමට නොහැකි බවත්, මේ රාජ්‍ය යාන්ත්‍රනය ගැන කතා කිරීමේදී මෙවැනි ක්‍රියාකාරකම් හමුවේදී මොනරාගල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති සභාපතිතුමන් ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයටත් සහා ලේකම් තුමා ප්‍රමුඛ සියලු කාර්ය මණ්ඩලයටත් මේ බල ප්‍රදේශයේ කිසිම කෙනෙකුගේ දෝෂාරෝපණයකට කතා බහකට ලක් නොවීම ඉතාමත් වාසනාවන්ත කාරණාවක් වන බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

V. ඒ වගේම පවතින ඉන්ධන අර්බුදයත් සමග ප්‍රාදේශීය සභාවේ කටයුතු වලට මහත් බලපෑමක් එල්ල වී ඇති අතර ඉදිරි වැසි සමයට ප්‍රථම බොහෝ අතුරු මාර්ග කපා සකස් කර දීමට ඇති බැවින් පවතින තත්ත්වය හමුවේ ආයතනයට අවශ්‍ය ප්‍රමාණයට ඉන්ධන ලබා ගැනීම සම්බන්ධයෙන් ඉහල නිලධාරීන් සමඟ සාකච්ඡා කර විශේෂ තෙල් කෝටාවක් ලබාගෙන මේ මාර්ග පද්ධති කඩිනමින් සකස්කර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටි අතර ඒ වගේම රනිල් වික්‍රමසිංහ ගරු ජනාධිපතිතුමන්ගේ බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා ධූරකාලය තවත් වසරකින් දීර්ඝ කර ඇති බැවින් එදා සිට අද දක්වා කටයුතු කළා හා සමානව අපි සියලු දෙනාම බුද්ධිමත්ව නිවැරදිව සහයෝගයෙන්යුතුව ඉදිරි කටයුතු කරමු යන්නත්, ඒ වගේම අපෙන් ඈතට ගිය හිටපු ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ගන්නා වූ නඩු තීන්දු ප්‍රකාරව නැවත රටේ ජනාධිපති ධූරය දැරීමට අවස්ථාව ලැබේවා කියා ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියලු දෙනාටම ස්තුතිය පුදකර සිටින ලදී.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

- මොනරාගල ප්‍රාදේශීය සභාවෙන් ජනතාවට ඉටු විය යුතු සේවාවන් හා වගකීම් හැකි උපරිම අයුරින් නිරතුරුවම ලබාදීමට කටයුතු කරන බවත්, ඒ වගේම ඉන්ධන ප්‍රශ්නය නිසා ප්‍රදේශයේ කටයුතු අකර්මණ්‍ය වීමට ඉඩ නොතබන අතර කෙසේ හෝ මේ සඳහා විසඳුමක් ලබා ගැනීමට කටයුතු කරන අතර ඉන් අනතුරුව ප්‍රදේශයේ අතුරු මාර්ග සියල්ල ද සකස් කිරීමේ වැඩපිළිවෙල නැවත ක්‍රියාත්මක කරන බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

## 08.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල කුමාරසිරි මැතිතුමා

I. අවසර ගැනීමෙන් අනතුරුව අවුරුදු හතළිහක පමණ දේශපාලන අත්දැකීම් සහිත පරිපූර්ණ නායකයකු වශයෙන් ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන් වර්තමාන රටේ වගකීම භාරගෙන කටයුතු කිරීමට පත් වීම සම්බන්ධයෙන් එතුමන්ට ගෞරවනීය ස්තූතිය පුද කර සිටින බවට ගරු මන්ත්‍රී තුමන් සඳහන් කර සිටි අතර ඒ වගේම සුනිල් අරංගල ගරු මන්ත්‍රී තුමන් ප්‍රකාශ කළා වගේ පක්ෂ පාට භේදයකින් තොරව අපි කොයි කවුරුත් මේ මොහොතේ රට ගොඩ ගැනීමේ සංග්‍රාමයට උපරිම දායකත්වය සහ සහයෝගය ලබා දිය යුතු බවද සඳහන් කර සිටින ලදි.

II. ඒ වගේම නක්කල සිට මදුරුකැටිය දක්වා දිවෙන මාර්ගය දෙපස බොහෝ ලෙස තණකොළ වැවී මාර්ගය දෙපසටම වැවී ඇති අතර සභාවට අයත් මාර්ගයක් බැවින් සභාවේ කම්කරුවන් කිහිප දෙනෙකු හෝ යොදවා එම මාර්ගය සුද්ධ පවිත්‍ර කර දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසට ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

III. ඒ වගේම වැදිකුඹුර අලියාවත්ත හී පදිංචි කේ.එම්.ඒ. නන්දා මාලනී නැමති අයෙකු විසින් එම ප්‍ර දේශයේ පවත්වාගෙන යනු ලබන ප්‍රජාමූල ජල සංවිධානය මගින් තම නිවසට වතුර ලබා නොදෙන බවත්, අදාල සමිතියේ කටයුතු වලදී බොහෝ සහයෝගයන්ද ඇය විසින් ලබා දී තිබුණද සමතියේ යම් විරුද්ධත්වයක් මත මෙවැනි තීරණයක් ගෙන ඇති බවත්, ඉතා වයෝවෘද්ධ මෑණියන් සමඟ ජීවත්වන තම නිවසට වතුර ලබා නොදෙන බව ඇය විසින් සඳහන් කරමින් තමන් වෙතද ලිපියක් ඉදිරිපත් කර ඇති බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටි අතර මේ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදීම එතුමිය විසින් ගරු සභාපතිතුමන්ගෙන්ද උදව් උපකාර ඉල්ලා ඇති අවස්ථාවන් වලදී ගරු සභාපතිතුමන් ඇයට අවශ්‍ය උදව් උපකාර කර ඇති බව ද දැනුම් දී ඇති අතර එම වයෝවෘද්ධ මෑණියන්ගේ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා ජලය ඉතා අවශ්‍යව පවතින බැවින් කෙසේ හෝ එම නිවසට ජලය ලබා දීමට උදව් කරන ලෙස ඉල්ලීම් කර ඇති බැවින් ගරු සභාපතිතුමන්ගේ බලතල භාවිත කරමින් මේ සම්බණ්ධව සොයා බලා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

IV. ඒ වගේම නගරයේ නව වෙළඳ සංකීර්ණයේ දෙවැනි මහල ඉදි කිරීම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියත් සමඟ සාකච්ඡා කර පුළුවන්කමක් පවතින්නේ නම් ඉදිරියට බිහිවීමට

නියමිත විශාල ව්‍යාපාරිකයින් ගැන සලකා බලා ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන්න කියා ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටි අතර ඒ වගේම මීට පෙර සභා වාර වල දී සාකච්ඡා කර ඇති පරිදි බිබිල පාර ශරීර සුවතා මධ්‍යස්ථානයේ ඇති ගොඩනැගිල්ලේ ඉහළ මහලයේ හෙළ බොජුන් හලක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සුදුසු බවත් ,එමගින් කිහිප දෙනෙකුටම ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට රැකියා අවස්ථා ලබා ගත හැකි අතර සභාවට ද

මෙමගින් යම් ආදායමක් ලබා ගැනීමට හැකියාවක් පවතින බැවින් මේ වන විට විශාල ජනතාවක් පැමිණෙන ස්ථානයක් බැවින් මේ සම්බන්ධව අවධානය යොමු කර කඩිනමින් ක්‍රියාත්මක වන ලෙස ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි.

V. ඒ වගේම ප්‍රාදේශීය සභාවෙන් සිදුකරන සංවර්ධන ක්‍රියාදාමයන් ඉටුකිරීමේදී ඒ සම්බන්ධයෙන් සභාවේ සියලුම මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම වැදගත් කාරණාවක් වන බැවින් ඒ සම්බන්ධව අවධානය යොමුකර ඉදිරි කටයුතු කරන ලෙසත්, ඒ වගේම තමන්ගේ අදහසක් වශයෙන් අප දිස්ත්‍රික්කය තුළ අසල්වැසි ප්‍රාදේශීය සභා කීපයක් එකතු වී පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් තම තමන්ගේ පෞද්ගලික මුදලින් යම් මුදලක් දායක කරගෙන සුහද හමුවක් පැවැත්වීම කාලෝචිත වශයෙන් ඉතා හොඳ කටයුත්තක් බැවින් තම පක්ෂ වල දිස්ත්‍රික් නායකයින් ද කැඳවාගෙන කුඩා ක්‍රීඩා තරඟ කිහිපයක් පවත්වා එක්දින වැඩසටහනක් පැවැත්වීමට සියලුදෙනාම සාකච්ඡා කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමු බවත්, ඒ වගේම හෙට දිනයේ රටේ ඉදිරි ගමන වෙනුවෙන් ඕනම දේකට අපි සූදානම් බවද ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියලු දෙනාටම ස්තූතිය පුදකර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- නක්කල මදුරුකැටිය මාර්ගය ලබන සතියේ දිනයක සුද්ද පවිත්‍ර කිරීමට කටයුතු කරන බවත්, ඒ වගේම අලියාවත්ත නන්දා මාලනී මහත්මියගේ ජල ප්‍රශ්ණය සඳහා දැනුම් දීමක් මත මීට පෙර සභාවේ ජල බවුසරය දෙපාරක් පමණ ලබා දුන් අතර විශේෂයෙන්ම මෙම නිවසේ වයෝවෘද්ධව එක්තැන් වී සිටින කාන්තාවක් සිටින බැවින් එම මවගේ පිරිසිදු කිරීම් කටයුතු වෙනුවෙන් ජල අවශ්‍යතාවය වැඩියෙන් පවතින අතර මේ සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමේදී ප්‍රජාශාලාව අසල ඇති ප්‍රජා ජල ව්‍යාපෘති කාර්යාලයේ කළමනාකාරතුමිය විසින් මෙම නිවසට ජලය ලබා නොදෙන ලෙසට අදාල ජල සමිතිය වෙත ලිපියක් යොමු කර ඇති අතර එසේ කළේ කුමන හේතුවකටද යන්න සොයා බලා මේ සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන බවට ගරු සභාපතිතුමන් සඳහන් කර සිටින ලදි.

- ඒ වගේම නව වෙළඳ සංකීර්ණයේ දෙවැනි මහල ඉදි කිරීම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියත් සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිත බවත්, ඒ වගේම බිබිල පාර ශරීර සුවතා මධ්‍යස්ථානයේ ඇති ගොඩනැගිල්ලේ ඉහළ මහලයේ හෙළ බොජුන් හලක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට ද සැලසුම් සකස් කරමින් පවතින අතර, එසේම ප්‍රාදේශීය සභා එක්ව සුහද හමුවක් පැවැත්වීම ඉතා හොඳ කටයුත්තක් බැවින් ඉදිරි මාස දෙකක් පමණ ගිය පසු මෙම වැටසටහන සිදු කිරීමට සාකච්ඡා කර ගන්නා ලෙසත් ගරු සභාපතිතුමන් සඳහන් කර සිටින ලදි.

## 08.5 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා</u>

I. අවසර ගැනීමෙන් අනතුරුව මොණරාගලට පරිපාලන මෙහෙයුම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් නගර සභාවක් ලබාදීම සඳහා කටයුතු කළ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය වර්ථමාන අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත් ඒ වගේම මේ සඳහා මැදිහත් වී කටයුතු කළ ප්‍රදේශයේ ගරු සභාපතිතුමා, දිස්ත්‍රික් නායක ගරු ශෂින්ද්‍ර රාජපක්ෂ මැතිතුමාටත්,

කුමාරසිරි රත්නායක මැතිතුමා ඇතුළු සියලු දෙනාටම ගෞරවනීය ස්තුතිය පුද කර සිටින බව ගරු මන්ත්‍රී තුමා ප්‍රකාශ කර සිටින ලදි.

II. ඒ වගේම පසුගිය දිනවල රටේ පැවති දැඩි අරගල හමුවේ දී ලිබියාවට ඉරාකයට සිදුවූ ආකාරයේ බිහිසුණු අත්දැකීම් සිදුවීමට පෙර ඉතාමත් බුද්ධිමත්ව තීරණයක් ගෙන අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් නිහතමානිව ගෞරවාන්විතව රටින් පිට වී ගිය අතර මේ වන විට රටේ සියලුම දේශපාලන පක්ෂ එකට එකතු වී කටයුතු කිරීමට එකතු වී සිටීම ඉතා සාධනීය ලක්ෂණයක් වන අතර ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමන් රටේ නායකයා වශයෙන් තෝරාගෙන රටේ ආර්ථිකය නගා සිටුවීමේ ක්‍රියාදාමයට දායක වී ඇති මොහොතක හැමදාමත් ලේ පිපාසිත ව සිටින ජනතා විමුක්ති පෙරමුණ මේ ක්‍රියාදාමයට එකතු නොවී සිටීම බොහොම ලැජ්ජා සහගත කරුණක් බවත්,පසුගිය අරගල හමුවේ දී කූඨ උපක්‍රම භාවිත කරමින් තරුණ කණ්ඩායම් රවටා ගනිමින් කටයුතු කළ ආකාරය අනුව ඒ බව මනා ලෙස පැහැදිලි වන බවත් ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

III. ඒ වගේම මොනරාගල පාසල් වල ගුරුවරුන් තම උපකාරක පන්ති වලට එන තරුණ දරුවන් ද යොදවා ගනිමින් පසු ගිය දිනවල අරගල වලට සහභාගී වූ අතර පාසල් කාලය තුළදී ද සමහර ගුරුවරුන් මත්ද්‍රව්‍ය භාවිත කරමින් යම් යම් තැන් වලට ඒකරාශී වෙමින් අරගල කිරීම සඳහා සාකච්ඡා පවත්වමින් නින්දිතව කටයුතු කරන ගුරුවරුන් සිටින අතර මොනරාගල කලාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්තව සේවය කරන මේ පාසල්වල විදුහල්පතිවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කොට්ඨාශ අධ්‍යක්ෂකවරුන්ට තමන්ගේ කාර්ය මණ්ඩලය නිවැරදිව මෙහෙයවන්න බැරිවීම සම්බන්ධව දැඩි අප්‍රසාදය පළ කර සිටින බවත්, ඒ වගේම මොණරාගල රෝහලේද මේ අරගල සංවිධානය කරන හෙද නිලධාරීන් පිරිසක් සහ වෛද්‍යවරුන් පිරිසක් ද සිටින අතර අසරණ රෝගීන්ට ඉතා සැර පරුෂ ආකාරයට බැන වැදී රෝගීන් තව තවත් අසරණ කරන මෙම කණ්ඩායම් රට හදන්න අරගල වලට එන ජාතියක් වශයෙන් දැඩි අප්‍රසාදය පළ කර සිටින බව ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි.

IV. ඒ වගේම පසුගිය කාලය තුළ රටේ ආර්ථිකයට ප්‍රබල වශයෙන් බලපෑමක් වූ ඉන්ධන සහ ගෑස් ප්‍රශ්නය මේ වන විට යථා තත්ත්වයට පත්වෙමින් පවතින අතර විශේෂයෙන්ම අප රටට විදේශ විනිමය ඉපයීමට මෙන්ම රටේ සංවර්ධනයට දැවැන්ත දායකත්වයක් ගෙන ඇඟලුම් ක්ෂේත්‍රය,මෙන්ම වතු ප්‍රජාවටත් අවශ්‍ය වරප්‍රසාද හා පහසුකම් නිරතුරුව සපයමින් ඔවුන් පිළිබඳව අවධානය යොමු කරමින් නිරතුරුවම ඔවුන්ගේ ඕනෑ එපාකම් වලට පෙනී සිටිමින් ඔවුන්ට වටිනාකමක් ලබා දිය යුතු බව ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි.

V. ඒ වගේම මොනරාගල දිස්ත්‍රික්කයේ පාරිභෝගික සේවා අධිකාරියේ සිටින නිලධාරීන් මොන රාජකාරියක් කරනවාද යන්න තේරුම්ගත නොහැකි අතර බොහෝ වෙළඳසැල් වල භාණ්ඩ වල සලකුණු කර ඇති මිලට වඩා දෙතුන් ගුණයකින් මිල වැඩි කර අලෙවි කරන අතර විශේෂයෙන්ම හාඩ්වෙයාර් ,වාහන අමතර කොටස් අලෙවිකරණ ආදී වෙළඳසැල් හා අනිකුත් සියලුම වෙළඳ සැල් වල බොහෝ බඩු භාණ්ඩවල මිල වෙනස් කරමින් ඉතා ඉහළ මිල ගණන් යටතේ අලෙවි කරන අතර පාරිභෝගික සේවා පනත තුළ අදාල නිලධාරීන්ට හිමි බලතල

ක්‍රියාත්මක නොකරමින් ජරාවට වැඩ කරමින් නිකරුනේ වැටුප් ලබමින් නිදා සිටින මේ නිලධාරීන් වෙනුවෙන් දැඩි අප්‍රසාදය හා කණගාටුව පළකර සිටින බවත්, ඔවුන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් ඉහල නිලධාරීන්ට සභාව මගින් දන්වා යැවීමට කටයුතු කරන ලෙසත් මෙවැනි නිලධාරීන් සිටින තාක් කල් මේ රට ගොඩ ගැනීමට නොහැකි බවත් ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

VI. ඒ වගේම සිරිගල පස්වන පටුමග ඉතිරි කොටස මෝටර් ග්‍රේඩර් කර පිළිසකර කරගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඒ වගේම ගුණවර්ධන ගරු මන්ත්‍රී තුමන් පොහොර ප්‍රශ්නය මතු කළ නිසා මේ වන විට රසායනික පොහොර නොමැතිව කන්න තුනක් ම ගොවියන් වගා කටයුතු සිදු කළ අතර පසු ගිය දිනවල "කෑද බීමට වත් සහල් නොමැති වෙයි" යන්න විවිධ මාධ්‍යන්තුලින් නොයෙක් ආකාරයේ විවේචන තිබූ අතර කිසිම අවස්ථාවක රටේ සහල් හිඟයක් ඇති නොවූ අතර මෙවැනි අවස්ථාවලින් වැරදි පුවත් බෙදාහැරීමේ ජඩ මාධ්‍යකරණයක් ලංකාව තුල ක්‍රියාත්මක වීම ඉතා කණගාටුවෙන් ප්‍රකාශ කර සිටින බව ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි.

VII. ඒ වගේම මේ මොහොතේ දේශපාලනික වශයෙන් බෙදීම් වලට ලක් නොවී සියලු දෙනාම අත්වැල් බැඳ ගනිමින් රටේ ආර්ථිකය ගොඩනැංවීමේ ක්‍රියාදාමයට දායක වෙමින් කටයුතු කරමු බවත්, ඒ වගේම මොන ප්‍රශ්නයක් පැමිණියද බල ප්‍රදේශයේ කටයුතු නිසි පරිදි කළමනාකරණය කර ගනිමින් නිවැරැදිව කටයුතු කිරීමට ගරු සභාපතිතුමා සැමවිටම උත්සාහ ගන්නා අතර අපි සියලු දෙනාගේම උපරිම සහයෝගය ඒ වෙනුවෙන් ලබාදෙන බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමන් සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

- මොනරාගල ප්‍රදේශයේ වෙළඳසැල් වලින් වැඩි මිල ගණන් යටතේ භාණ්ඩ අලෙවි කරනවාද යන්න සම්බන්ධයෙන් නිරතුරුවම සොයා බලන අතර පසු ගිය දිනකද වැඩි මිලට අලෙවි කිරීමට තිබූ සහල් මිටි 50ක් පමණ සොයා ගැනීමෙන් පසු ඒ සඳහා නීතිය ක්‍රියාත්මක කර වූ බවත්, ඒ වගේම බොහෝ වෙළඳසැල්වලින් පැරණි මිල ගණන් වලට අලෙවි කරන අතර ඒ වගේම මේ වන විට බොහෝ දෛනික ආහාර වල මිළ ගණන් පහත බැස ඇති බැවින් විශේෂ ගැටලුවක් නොමැති බව ගරු සභාපතිතුමන් සඳහන් කර සිටින ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

- අනතුරුව සභිකවරුන්ගේ වෙනත් කරුණු තව දුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ලබන මස සභා රැස්වීම 2022 වර්ෂයේ සැප්තැම්බර් මස 16 වන සිකුරාදා දින ප.ව.2.30 ට යොදා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් සඳහන් කර සිටි අතර සභාවේ සියළු දෙනාගේම එකඟතාවය මත එය සභා සම්මත කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි ගරු උප සභාපතිතුමන් ඇතුළුව සියලුම මන්ත්‍රීවරුන්,

මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.5.15 ට අවසන් කරන ලදී.

2022.08.12 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

සභා වාර්තාව .......................................................................... වන දින පැවැති මහ සභාවේ.............................................................................................................යෝජනාවෙන් සහ...................................................................................................................ස්ථිරත්වයෙන්

ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.